ලුහුඬින්, නිර්මාණශීලීව අදහසක් ලබාදෙන අයුරින් පුවත්පතක ලිපි සහ පුවත් වාර්තා සඳහා සිරස්තල යෙදීමද සැබවින්ම කලාවකි. එම සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමට මාධ්‍යවේදීන්ට ඉඩප්‍රස්තාව තිබිය යුතු බව සැබවි. එනමුත්, එම සිරස්තල භාවාතිෂය වීම ගැටළුවක් වන අවස්ථාවන් පිළිබඳවද මාධ්‍යවේදීන් සවිඥාණික විය යුතු වේ. මන්දයත්, භාවාතිෂය (sensationalised) සිරස්තල ඔස්සේ ඊට ප්‍රස්තුත වන පුවතේ බරපතළ බව මෙන්ම එහි සියුම් තොරතුරුද පාඨකයාගේ අවධානයට හසු නොවී ගිලිහී යෑමේ ඉඩක් ඇති බැවිනි.

උදාහරණයක් ලෙසට, පසුගිය දිනක කාන්තාවක් ඝාතනය වීමේ පුවත පාදක කරගනිමින්, සති අග අරුණ පුවත්පතේ පළ වී තිබූ සමාජ පැතිකඩ කිහිපයක් විමසුම් කරමින් ලියැවුණු ලිපියක් දැක්විය හැක. එහි සිරස්තලය ලෙසින් "දූ කෙළියයි, රති කෙළියයි, සූට්කේස් එකයි, මළ කෙළියයි" යනුවෙන් යෙදී තිබිණි.

ඒ අනුව,

1) මෙම සිරස්තලය ඔබට අනුව භාවාතිෂය වන්නේ ද?

2) ඔබ මෙම සිරස්තලයට එකඟ වන්නේ ද?

(එසේම, මෑතකදී ඝාතනයට ලක්වූ කුරුවිට තරුණියගේ ඡායාරූපයක්ද එම ලිපිය හා ඉදිරිපත් වී තිබිණි. එම සිදුවීම පුළුල්ව සමාජ අවධානයට ලක්වීම හා බැලූ විට, එම ඡායාරූපය පළ කිරීම ඔස්සේ මියගිය අයවලුන්ගේ පවුලේ අයට අනවශ්‍ය සිත්වේදනාවන් ඇති නොවන්නේ ද යන්න Ethics Eye මින් පෙර සාකච්ඡාවට ගෙන ඇත.)